## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[Matara S. O. 15—1908]

වෂී 1908ක්වූ නොවැම්බ්‍ර මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වෂී 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 24 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණු ලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ඇෆ්ජ්. එව්ස් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇෆ්ජ්. එව්ස්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

---

### ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ වැලිගම්කෝරලේ කිලිට්ටුව යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සහතික සිතියම්වල* පෙනීයන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.

මුල් සිතියම 546.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 73 ... | නාකන්දේගොඩ, නාකන්දේගොඩමූකලාන ... ... | 28 0 20 |

මිට මායිම්—උතුරට ඇහල්පේ යන ගමේ ගම්ඉමද; නැගෙණහිරට කිරින්ගොඩආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන බෙලිඅතතගාවද, එම අය විසින් අයිතිකම්කියන විලගමදෙනියද, කරසින්නආරච්චිගේ සිඤ්ඤෝඅප්පු විසින් අයිතිකම්කියන කජුගහදෙනියේවත්තද, රජසන්තක කජුගහවත්තේ ඉහලදෙනියද, කරසින්ආරච්චිගේ සිඤ්ඤෝඅප්පු විසින් අයිතිකම්කියන කජුගහවත්තේදෙනියද; කිරින්ගොඩ ආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන කජුගහදෙනියද, රජසන්තක නාකන්දගොඩබිට්ටද, කිරින්දගොඩආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන ඉහලඹඩේද, එම අය විසින් අයිතිකම්කියන වලගාව නොහොත් පහලඹඩේද; දකුනට කරසින්ආරච්චිගේ සිඤ්ඤෝඅප්පු විසින් අයිතිකම්කියන වලගාවවත්තද, රජසන්තක නාකන්දගොඩහේනද, රජසන්තක නාකන්දගොඩබිට්ටද, රජසන්තක නාකන්දගොඩහේනද; බස්නාහිරට කැරවක්බොක්ක යන ගමේ ගම්ඉමද.

II.

මුල් සිතියම 546.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 105 ... | ආරුපයාහොඩ යටිවගුරේහේන, යටිවගුරේගොඩහේන, යහලමුල්ලේහේන, තිරිවානාකැටිය ... ... ... | 79 0 1 |

මිට මායිම්—උතුරට ඇල්ලගොඩගමගේ දෙන් එව්ස් සහ තවත් අය විසින් අයිතිකම්කියන ගමගේවත්තද, ඇල්ලගොඩගමගේ දෙන් ජුවානිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන ගමගේවත්තද, රජසන්තක මහගෙදර වත්ත නොහොත් කකරසින්ගේවත්තද, රජසන්තක මහබොටුවානේගේවත්තද, රජසන්තක යහලමුල්ලවත්තද, කිරින්ගො

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1523—1527 වෙනි පිටුවල ප්ලෑන් බලනු.

ඛආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන මාබොටුවාහේවතතද, දෙවුන්දර එරසාරගේ දෙන් මාර්ලස් සහ තවත් අය විසින් අයිතිකම්කියන යහලමුල්ලේදෙනිය නොහොත් යහලමුල්ලේගොඩකැල්ලද, සමරප් පුලිගේ දෙන් නිකුලස් සහ තවත් අය විසින් අයිතිකම්කියන යහලමුල්ලේපහලකැල්ලද, ආණ්ඩුව සහ කැටන්විල ලිය නගේ බබන්අප්පු විසින් අයිතිකම්කියන දෙලගාවාකුඹුරියද, කිරින්ගොඩ ආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩගහමුල්ලදෙනියද, කැටන්විල ලියනගේ බබන්අප්පු විසින් අයිතිකම්කියන මිගහවත්තද, එම අය විසින් අයිතිකම්කියන බක්මීගහදෙනියද, කිරින්ගොඩ ආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිති කම්කියන වඩුමුල්ලේවත්තද, එම අය විසින් අයිතිකම්කියන වඩුමුල්ලේදෙනියද, රජසන්තක වඩුමුල්ලේදෙනියේඕවි වද, රජසන්තක බෙරලියගස්දෙලමූකලානද; නැගෙණහිරට එරමුදුගොඩ යන ගමේ ගම්ඉමද; දකුණට එරමුදුගොඩ යන ගමේ ගම්ඉමද, කැටන්විල යන ගමේ ගම්ඉමද ; බස්නාහිරට කරසින්ආරච්චිගේ දෙන් කොර්නේලිස් විසින් අයිති කම්කියන උඩඅරූපයද, එම අය විසින් අයිතිකමකියන යටිවගුරද, මද්දේගේ පුංචිඅප්පු විසින් අයිතිකම්කියන දෙලේ මුල්ලේවත්තද, මද්දගේ පුංචිඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන දෙලමුල්ලේවත්තද, මද්දගේ පුංචිඅප්පු සහ ආණ්ඩුව විසින් අයිතිකම්කියන කිම්බොටුකනත්ත නොහොත් දෙලමුල්ලේවතතද, මද්දගේ පුංචිඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන දෙලමුල්ලේදෙනියද, 201,770වේ පිඹුරුකඩදසියේ ජේන ඉඩමද, මද්දගේ පුංචිඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන මද්දගේවතතද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටිය මේ දැන්වීමෙන් අත්අැරිය වගත් ඒකේ බිම් තරමවන පර්චස් 31ක ඉහතකී අක්කර 79කුත් පර්චස් 1කේ බිම්තරමේ අඩංගුනොවෙනවගත් මෙයින් දැන ගතයුතුයි.

මුල් සිතියම 546.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 35 | ... | දෙලමුල්ලේඉහලදෙනිය ... ... | ... | 0 0 31 |

III.

මුල් සිතියම 546.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 108 | ... | කැටිගල්දෙලේහේන, තැන්නේපිටමූකලාන, ජම්බුගහගොඩහේන | ... | 29 0 1 |
| 109*a* | ... | ජම්බුගහදෙනියේහේන (5,828/14,282 මුල්සිතියමේ ජේන ඉඩම) | ... | 0 1 35 |
| 110 | ... | බෙරලියගස්දෙලමූකලාන, කැටිගල්දෙලමූකලාන ... | ... | 87 3 14 |
| | | | | 117 1 10 |

හිට මායිම්—උතුරට ඇහලජේ යන ගමේ ගම්ඉමද, ආණ්ඩුව සහ යහලගේ බබුවා විසින් කොටුකරගන අයිති කම්කියන තැන්නේපිටදෙනියද. 191,785 සහ 208,321කේ පිඹුරුකඩදසිවල ජේන ඉඩම්ද, ඇහැලජේ යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට එරමුදුගොඩ යන ගමේ ගම්ඉමද; දකුණට රජසන්තක තිරුවානාකැටියද, රජසන්තක වඩු මුල්ලේදෙනියඕවිටද; බස්නාහිරට කිරින්ගොඩආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන වඩු මුල්ලේදෙනියද, ආණ්ඩුව සහ සමරප්පුලිගේ දෙන් නිකුලස් සහ තවත් අය විසින් අයිතිකම්කියන කනත්තගේවතතද, සමරප්පුලිගේ දෙන් නිකුලස් සහ තවත් අය විසින් අයිතිකම්කියන ලිඳගාවාදෙනියද, 144,767තේ පිඹුරුකඩදසියේ ජේන ඉඩමද, ආණ්ඩුව සහ කිරින්ගොඩආරච්චිගේ පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන කුරුඳුවත්තද, රජ සන්තක කුඩඑවිලේදෙනියද, කේ. පිලිප් සහ තවත් අය විසින් අයිතිකම්කියන කුඩඑවිලේ පොල්කොරටුවද නාරන් ගොඩආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන නාරන්ගස්වත්තේදෙනියද, කිරින්ගොඩ ආරච් චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩහාමුල්ලේවත්තද, කිරින්ගොඩආරච්චිගේ දෙන් අබ රන් සහ තවත් අය විසින් අයිතිකම්කියන ගොරෙක්ගහදෙනියද, කරින්ගොඩආරච්චිගේ දෙන් පිලිප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන දෙල්ගහපෙතද, කට්ටිගලදෙලද, එම අය විසින් අයිතිකම්කියන ජම්බුගහදෙනියද, එම අය විසින් අයිතිකම්කියන ජම්බුගහදෙනියේඕවිටද, එම අය විසින් අයිතිකම්කියයන විලගමදෙනියද, එම අය විසින් අයිතිකම්කියන බෙලිඅත්තගාවද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මෙම දැන්වීමෙන් අත්හැරිය වගත් ඒවායේ මුල් බිම්තරමවන අක්කර 2කුත් පර්චස් 10ය ඉහතකී අක්කර 117කුත් රූඩ් 1කුත් පර්චස් 10යේ බිම්තරමේ අඩංගු නොවන වගත් මෙයින් දැනගත යුතුයි.

මුල් සිතියම 546.

| බිම්කට්ටිය. | | ඉඩමේ නම. | | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 106 | ... | කට්ටිගල්දෙලේදෙනිය (194,393නේ පිඹුරුකඩදසියේ ජේන ඉඩම) | ... | 1 1 0 |
| 107 | ... | කට්ටිගල්දෙලේදෙනිය ... ... | ... | 0 0 16 |
| 109 | ... | ජම්බුගහදෙනියේහේන (206,146 පිඹුරුකඩදසියේ ජේන ඉඩම) | ... | 0 2 34 |
| | | | | 2 0 10 |

3,252

[Hambantota S. O. 144—1908]

වෂී 1908ක්වූ නොවැම්බ මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නො හොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩු බිම් සම්බන්ධව වෂී 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ජේ. ජී. ප්‍රේසර් උන්නාන්සේ ගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිති වාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන් සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ජී. ප්‍රේසර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

## ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ පල්ලත්තර යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සහතික පිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 6 ... | වන්ගෙඩිකැපුපිට්ටනිය ... ... ... | 2 0 39 |

මීට මායිම්—උතුරට මුල්කිරිගල යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට 193,167ෙත් පිඹුරුකඩදසියෙන් පෙනෙන ඩමද; දකුනට 193,167, 193,168, 193169 පිඹුරු කඩදසිවල පෙනෙන ඉඩම්ද; බස්නාහිරට මුල්කිරිගල ආර්. දෙන් න්දිරිස් විසින් අයිතිකමකියන පුල්ගහවලද.

II.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 7 ... | කැටන්ගහහේන ... ... ... ... | 6 2 24 |
| 7b ... | එම නොහොත් ගොඩවානේහේන ... ... ... | 0 3 34 |
| | | 7 2 18 |

මීට මායිම්—උතුරට මුල්කිරිගල යන ගමේ ගම්ඉමද, 225,084 පිඹුරු කඩදසියෙන් පෙනෙන ඉඩමද; නැගෙන ඉරට බැදිගම යන ගමේ ගම්ඉමද; දකුනට වැවේගෙදර රත්නායකගේ බබාහාමි විසින් අයිතිකම්කියන තෙල්කොල ආරේදෙනියද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන තෙල්කොලආරේවැවද, 193,163, 193,164, 193,165, 193,166 පිඹුර කඩදසිවල පෙනෙන ඉඩම්ද; බස්නාහිරට මුල්කිරිගල යන ගමේ ගම්ඉමද.

III.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 8 ... | තෙල්කොලආරේවැව ... ... ... | 1 2 1 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කැටන්ගහහේනද; නැගෙනහිරට වැවගෙදර බබාහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන තෙල්කොලආරේදෙනියද; දකුනට 193,162 පිඹුරු කඩදසියෙන් පෙනෙන ඉඩමද, 193,163 පිඹුරු කඩදසියෙන් පෙනෙන ඉඩමද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කැටන්ගහ හේනද.

IV.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 10 ... | වත්තේවැවහේන ... ... ... ... | 1 0 10 |

මීට මායිම්—උතුරට වැවගෙදර රත්නායකගේ බබාහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන තෙල්කොල ආරේවැවදෙනියද; නැගෙනහිරට සහ දකුනට බැදිගම යන ගමේ ගම්ඉමද; බස්නාහිරට 193,161 පිඹුරු කඩදසියෙන් පෙනෙන ඉඩමද.

V.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 11a ... | ඉඟිනිගස්යාය (පාරට ඉතුරුකරපු බිම්කට්ටිය) ... ... | 0 0 30 |

මීට මායිම්—උතුරට 193,112 පිඹුරු කඩදසියේ පෙනෙන ඉඩමද; නැගෙනහිරට සහ දකුනට බැදිගම යන ගමේ ගම්ඉමද; බස්නාහිරට 216,180, 193,112 පිඹුරු කඩදසිවල පෙනෙන ඉඩම්ද.

VI.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 16 ... | කෝන්ගහහේන (පාරට ඉතුරුකරපු බිම්කට්ටිය) ... ... | 0 0 35 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කෝන්ගහහේනද; නැගෙනහිරට ගලාපතිගේ පින්හාමි විසින් අයිතිකම්කියන කපුගමගේහේනද; දකුනට ආණ්ඩුව විසින් අයිතිකම්කියන කෝන්ගහහේනද; බස්නාහිරට ජයවික්‍රමකන්කානන්ගේ දෙන් අබරන් විසින් අයිතිකම්කියන පහලවත්තද, ආණ්ඩුව සහ නම්බිගේ ජයන් විසින් අයිතිකම්කියන කිරිගේහේනද.

VII.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 37 ... | මැදපෝටාව ... ... ... ... | 0 1 5 |

මීට මායිම්—උතුරට ගන්බොඩගේ බබින්සා විසින් අයිතිකම්කියන මැදවැවගාවකොරටුවද; නැගෙනහිරට ගන්බොඩගේ සිමිරිස් විසින් අයිතිකම්කියන මැදකුඹුරද; දකුනට සහ බස්නාහිරට ගන්බොඩගේ බබින්සා විසින් අයිතිකම්කියන මැදවැවගාවකොරටුවද.

VIII.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 38 ... | ආවාරිගේවැව ... ... ... ... | 0 2 9 |

මීට මායිම්—උතුරට සමරනායක ජනිසා විසින් අයිතිකම්කියන ඉහලආවාරියාවැකඩද; නැගෙනහිරට ගන්බොඩගේ බබානිස් සහ තවත් අය විසින් අයිත්කම්කියන ආවාරියාවැකඩද; දකුනට ගන්බොඩගේ බබානිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන මැදවැවගාවකොරටුවද; බස්නාහිරට සමරනායක ජනිසා විසින් අයිතිකම්කියන ඉහලආවාරියාවැකඩද.

* ඉංග්‍රිසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1528—1543 වෙනි පිටුවල ප්ලෑන් බලනු.

## IX.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 44 | ගෙවල්ගාවදෙණියේවැව | 0 2 8 |

මීට මායිම්—උතුරට ජයවික්‍රමආච්චිගේ දොන් බස්තියන් විසින් අයිතිකම්කියන සියඹලාගහහේනද; නැගෙනහිරට ජයවික්‍රමආච්චිගේ දොන් බස්තියන් විසින් අයිතිකම්කියන සියඹලාගහහේනද, ආණ්ඩුව විසින් සහ ජයවික්‍රම ආච්චිගේ දොන් බස්තියන් විසින් අයිතිකම්කියන අළුත්වත්තද; දකුනට හපුහන්ත්‍රිගේ අදිරියන් විසින් අයිතිකම් කියන අඹගහවත්තද; බස්නාහිරට ජයවික්‍රමආච්චිගේ සිංඤෝඅප්පු විසින් අයිතිකම්කියන ගෙවල්ගාවදෙණියද.

## X.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 54 | මලපලාවැව | 2 2 0 |

මීට මායිම්—උතුරට ජයවික්‍රමආච්චිගේ සිංඤෝඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන ගෙවල්ගාවා දෙණියද; හපුහන්ත්‍රිගේ අදිරියන් විසින් අයිතිකම්කියන අඹගහවත්තද; නැගෙනහිරට බෙලිගල්ලේ විදානේගේ අන්දිරිස් විසින් අයිතිකම්කියන බෙලිගල්ලේගෙදරවත්තද; ජයවික්‍රමආච්චිගේ සිඤ්ඤෝඅප්පු විසින් අයිතිකම්කියන මැදහාල්පන්දෙණියද; දකුනට විදානපතිරනගේ බබා සහ තවත් අය විසින් අයිතිකම්කියන ගල්තැන්හේන්වත්තද; බස්නාහිරට 69,642 පිඹුරුකඩදාසියෙන් පෙනෙන දරඅන්ඩකුඹුරද; සමරසින්ගේ විළුහාමි සහ තවත් අය විසින් අයිති කම්කියන ගොඩතුල්ලද.

## XI.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 65 | කටුවේවැව | 0 1 9 |

මීට මායිම්—උතුරට සහ නැගෙනහිරට 193,160 පිඹුරුකඩදාසියේ පෙනෙන ඉඩමද; දකුනට මුල්කිරිගල විහාරය විසින් අයිතිකම්කියන කටුවේදෙණියද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන පන්ගන්වෙලමන්ඩියද; ආණ්ඩුව විසින් අයිතිකම්කියන පාතමගේහේනද.

## XII.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 66 | පන්ගන්වැල්මන්ඩිය | 4 2 12 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන පාතමගේහේනද; නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිති කියන කටුවේවැවද, මුල්කිරිගල විහාරේ විසින් අයිතිකම්කියන කටුවේදෙණියද; ආණ්ඩුව විසින් අයිතිකම්කියන පතිරනගේවැවද, ජයවික්‍රම කන්කානන්ගේ දොන් අල්ලිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩගැටම්බරාවල දෙණියද; දකුනට ජයවික්‍රමකන්කානන්ගේ දොන් අල්ලිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩගැටම්බරාවල දෙණියද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන ගොඩකදුරුගහපෝටාවද; බස්නාහිරට දොන් බස්තියන් විසින් අයිතිකම් කියන පන්ගන්වැල්මන්ඩියද.

## XIII.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 74 | ගොඩකදුරුගහපෝටාව | 0 3 20 |

මීට මායිම්—උතුරට සහ නැගෙනහිරට ආණ්ඩුව විසින් අයිතිකම්කියන පන්ගල්වැල්මන්ඩියද; දකුනට ජයවික්‍රමකන්කානන්ගේ දොන් අල්ලිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩගැටම්බරාවලදෙණියද, ජයවික්‍රම ආච්චිගේ දොන් අන්දිරිස් විසින් අයිතිකම්කියන ජුලේහේනද; බස්නාහිරට ජයවික්‍රමකන්කානන්ගේ බබුන්හාමි විසින් අයිතිකම්කියන නින්දේමන්ඩියද.

## XIV.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරට. අ. රූ. ප. |
|---|---|---|
| 75 | පතිරනගේවැව | 1 1 8 |

මීට මායිම්—උතුරට මුල්කිරිගල විහාරේ විසින් අයිතිකම්කියන කටුවේහේනද; නැගෙනහිරට මුල්කිරිගල විහාරේ විසින් අයිතිකම්කියන කටුවේදෙණියද, 200,314, 193,646 පිඹුරුකඩදාසිවල පෙනෙන ඉඩම්ද; දකුනට ජයවික්‍රමකන්කානන්ගේ දොන් අල්ලිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන උඩගැටම්බරාවලදෙණියද; බස්නාහිරට එච්. දොන් බස්තියන් සහ තවත් අය විසින් අයිතිකම්කියන පන්ගන්වැල්මන්ඩියද.

## XV.

මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 79 | පාතගැටම්බරාවැව | 2 1 17 |

මීට මායිම්—උතුරට ජයවික්‍රමකන්කානන් දොන් අල්ලිස් විසින් අයිතිකම්කියන උඩගැටම්බරාවලදෙණියද; නැගෙනහිරට ඩබ්ලිව්. පුන්චිඅප්පු විසින් අයිතිකම්කියන නුගගහදෙනිය යනාදියද, හේවාපුචක්දන්ඩාවගේ සිඤ්ඤෝඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන ගැටම්බරාවැවද; දකුනට හේවාපුචක්දන්ඩාවගේ සිඤ්ඤෝඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන ගැටම්බරාවැවද, ජයවික්‍රමආරච්චිගේ දොන් අන්දිරිස් විසින් අයිතිකම්කියන ජුලේහේනද; බස්නාහිරට ජයවික්‍රමආච්චිගේ දොන් අන්දිරිස් විසින් අයිතිකම්කියන ජුලේගේහේවත්තද.

## XVI.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 118 ... | ඉහලවැව ... ... ... ... | 3 0 6 |

මීට මායිම්—උතුරට බාලදුරගේ සිඤ්ඤො විසින් අයිතිකම්කියන ගෙඩවානේහේනද, ඇඞ්. ජනිසා විසින් අයිතිකම්කියන මද්දුමරාලගේහේනද; නැගෙනහිරට ඇම්. මෙදිරිස්හාමි විසින් අයිතිකම්කියන වත්තක්කිරියේදෙනියද, 224,678 පිඹුරකබඳසියේ පෙනෙන ඉඩමද, ඇස්. ඒ. දෙන් හෙන්දිරික් විසින් අයිතිකම්කියන කිවුල්ආරේදෙනියද; දකුනට මුඩුබිම් රෙගුලාසිය ප්‍රකාර රජසන්තක හැටියට ප්‍රසිඩකරපු වල්දෙකිහේනද; බස්නාහිරට පුන්චිහේවා පුන්චිබබා සහ තවත් අය විසින් අයිතිකම්කියන මයිලගහමුලන නොහොත් ඉහලවෙලද.

## XVII.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 120 ... | පින්වැව ... ... ... ... | 0 3 22 |

මීට මායිම්—උතුරට විදානපතිරනගේ දිනෝරිස්හාමි විසින් අයිතිකම්කියන වීරගහහේන යනාදියද; නැගෙනහිරට ආණ්ඩුව සහ ජේ. මහෙස්හාමි විසින් අයිතිකම්කියන ගාලගාවකොරටුවේදෙනියද; දකුනට 133,826 පිඹුරකබඳසියේ පෙනෙන ඉඩමද, පන්වැවගාවාහේනද (224,678 පිඹුරුකබඳසියේ පෙනෙන ඉඩමද); බස්නාහිරට මුල්කිරිගල පන්සල විසින් අයිතිකම්කියන පින්දෙනියද.

## XVIII.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 141 ... | කනමගුරාවේවැව ... ... ... ... | 8 3 18 |

මීට මායිම්—උතුරට 193,645 සහ 193,644 පිඹුරුකබඳසිවල පෙනෙන ඉඩම්ද; නැගෙනහිරට, ජයසේකර කුලසින්ආරච්චිගේ දෙන් එවිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන කනමගුරාවේකුඹුරද; දකුනට දෙන් දවිත් වෙල්විදානේ විසින් අයිතිකම්කියන ගොඩවානේහේනද, ජයසේකර කුලසින්ආරච්චිගේ දෙන් එවිස් විසින් අයිතිකම්කියන සියඹලාවේකොරටුවද, හේවාපුවක්දන්ඩාවගේ සිඤ්ඤොඅප්පු විසින් අයිතිකම්කියන ඉඟිනිගහහේනද; බස්නාහිරට හේවාපන්දන්ඩවාගේ සිඤ්ඤොඅප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන ගැටම්බරාවලද, එම අය විසින් අයිතිකම්කියන හතුපිට්ටනියද.

## XIX.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 159 ... | හුගවෙලවැව ... ... ... ... | 4 0 0 |

මීට මායිම්—උතුරට සෙනරත්ආරච්චිගේ දෙන් දිනෙස් සහ තවත් අය විසින් අයිතිකම්කියන පාතහුගේවලද; නැගෙණහිරට ගම්මැදිලියනගේ ජන්තිස්හාමි විසින් අයිතිකම්කියන අන්නාසිවත්තද, 220,089 පිඹුරුකබඳසියේ පෙනෙන ඉඩමද; දකුණට මුල්කිරිගල පන්සල විසින් අයිතිකම්කියන පින්දෙනියද; බස්නාහිරට ජී. පතිරනගේ දෙන් දවිත් විසින් අයිතිකම්කියන මගේදෙනිය නොහොත් ගිරුවාගේදෙනියද, මරදන විදානආරච්චි විසින් අයිතිකම්කියන පතිදෙරේහේන නොහොත් දිසාවගේවත්තද.

## XX.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 162 ... | මහහේන ... ... ... ... | 0 3 15 |

මීට මායිම්—උතුරට ආණ්ඩුව සහ මරදන විදානආරච්චි විසින් අයිතිකම්කියන දිසාවගේවත්ත නොහොත් මහහේනද; නැගෙණහිරට වීරකැටියේ සිට බෙලිඅත්තට යන පුළුපාරද; දකුණට ආණ්ඩුව සහ මරදන විදානආරච්චි විසින් අයිතිකම්කියන දිසාවගේවත්තෙහේනද; බස්නාහිරට මරදන විදානආරච්චි විසින් අයිතිකම්කියන මහහේන නොහොත් දිසාවගේවත්තද.

## XXI.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 209 . . | මැටිහක්කේවැව ... ... ... ... | 1 1 2 |

මීට මායිම්—උතුරට ආර්. දෙන් හෙන්ද්‍රික් විසින් අයිතිකම්කියන රතුනසිදේගේහාමිගේවත්තද, ඩබ්ලියු. පුන්චිබබා විසින් අයිතිකම්කියන නසිදේගේහාමිගේවත්තද, එච්. ඩී. බස්තියන් සහ තවත් අය විසින් අයිතිකම්කියන කෝන්ගහදෙනියද; නැගෙණහිරට 168,102 පිඹුරුකබඳසියේ පෙනෙන ඉඩමද; දකුණට ඩබ්ලියු. කේ. මුදලිහාමි විසින් අයිතිකම්කියන මූනසින්ගේවත්තද, එම අය විසින් අයිතිකම්කියන මූනසින්ගේහේනේකැල්ලද; බස්නාහිරට කන්කානන්ගේ මුදලිහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන මැටිහක්කේමුලනද.

## XXII.
### මුල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 249 ... | උඩහුගවලවැව ... ... ... ... | 0 2 22 |

මීට මායිම්—උතුරට මුල්කිරිගල පන්සල විසින් අයිතිකම්කියන පින්දෙනියද; නැගෙණහිරට හේවාකොලම්බගේ බබුන් විසින් අයිතිකම්කියන පල්ලේවෙලගේවත්තද; දකුණට මුල්කිරිගල පන්සල විසින් අයිතිකම්කියන උඩදෙනියද; බස්නාහිරට පලච්නේගේ පුන්චිබබා විසින් අයිතිකම්කියන තලගහවත්තද.

XXIII.

මූල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 311 | බැද්දේවෑකඩවැව ... ... ... ... | 0 3 20 |

මීට මායිම්—උතුරට ජී. ඩබ්ලියු. බබූන් සහ තවත් අය විසින් අයිතිකම්කියන බෙලිකැටියේදෙනියේයායද; නැගෙණහිරට කේ. ජී. කළුඅප්පු විසින් අයිතිකම්කියන පැනිවැල්හේනද; දකුණට ඇල්. සින්ගිඅප්පු විසින් අයිතිකම්කියන පල්ලේපත්ගුයායද; බස්නාහිරට ජී. ඩබ්ලියු. බබූන් සහ තවත් අය විසින් අයිතිකම්කියන බෙලිකැටියේ දෙනියේයායද.

XXIV

මූල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 422 | මැදපිට්ටනියේවැව ... ... ... | 1 0 7 |

මීට මායිම්—උතුරට ඇස්. ඩබ්ලියු. ඊ. දොන් මිගෙල් අප්පුහාමි විසින් අයිතිකම්කියන බෙරවායින්හේදෙනියේඅත්මගද ආණ්ඩුව විසින් අයිතිකම්කියන තෙලඹුගහහේනද, ආණ්ඩුව සහ දොන් දිනෙස් විසින් අයිතිකම්කියන තෙලඹුගහවත්තද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන තෙලඹුගහහේනද; නැගෙණහිරට වන්නිගමගේ දොන් දිනෙස් විසින් අයිතිකම්කියන ගොඩකදුරුගහදෙනියද; දකුණට ඩබ්ලියු. දොන් දිනෙස් විසින් අයිතිකම්කියන කරගහ කොරටුවද; බස්නාහිරට 69,689 පිඹුරුකඩදසියේ පෙනෙන ඉඩමෙන් කොටසක්ද.

XXV.

මූල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 435 | වගසින්ගේවැව ... ... ... ... | 0 3 39 |

මීට මායිම්—උතුරට ඩබ්ලියු. දොන් දිනෙස් සහ තවත් අය විසින් අයිතිකම්කියන බෙලිගහදෙනියද; නැගෙණහිරට ආණ්ඩුව සහ දිසානායකගේ දොවන්නාමි විසින් අයිතිකම්කියන ගොඩවාගෙන්හේනද; දකුණට ඩබ්ලියු. ලියනගේ දොන් ජනිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන වගසින්ගේදෙනිය; බස්නාහිරට පාරක්ද.

XXVI.

මූල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 449 | ලන්දේවලදෙනියේවැව ... ... ... | 0 0 38 |

මීට මායිම්—උතුරට සහ නැගෙණහිරට පී දොන් සිමන් අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන ලන්දේවලදෙනියද; දකුණට හන්ගමුව යන ගමේ ගම්ඉමද; බස්නාහිරට පල්ලත්තර පන්සල විසින් අයිතිකම්කියන පින්දෙනියද.

XXVII.

මූල් සිතියම 263.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 450 | වලපන්ගුවඅත්මගපොත්තේපන්ගුවඅත්මග ... ... | 0 1 25 |

මීට මායිම්—උතුරට පාරක්ද; නැගෙණහිරට ඩබ්ලියු. ලියනගේ දොන් ජනිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන වගසින්ගේදෙනියද; දකුණට වන්නිගමගේ දොන් දිනෙස් විසින් අයිතිකම්කියන පොත්තේපන්ගුවද; බස්නාහිරට එම අය විසින් අයිතිකම්කියන වලපන්ගුවද.

3,253

---

[Hambntota S. O. 145—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුල්තදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණ ලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ඩබ්ලියු. ඊ. වේට් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගතයුතුයි.

ඩබ්ලියු. ඊ වේට්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

---

ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ කදුරුපොකුන යන ගම පිහිටාත්බෙන මීට අමුනාපු සහතික සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මූල් සිතියම 311.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 253 | තුඹුවේහේන ... ... ... ... | 2 2 19 |
| 253*a* | එම ... ... ... ... | 0 0 24 |
| 253*a*1 | එම ... ... ... ... | 0 1 14 |
| 253*b* | එම ... ... ... ... | 0 0 30 |
| 253*c* | එම ... ... ... ... | 0 0 21 |
| 253*d* | එම ... ... ... ... | 0 1 31 |
| | | 3 3 19 |

මීට මායිම්—උතුරට මාතර සිට හම්බන්තොටට යන පාරද ; නැගෙණහිරට පච්චිරසායිබු විසින් අයිතිකම්කියන වැල්ලේකොරටුවද, මුහුදද ; දකුණට මුහුදද ; බස්නාහිරට ඩබ්ලිව්. දොන් එව්ස් විසින් අයිතිකම්කියන වැල්ලේකොරටුවද.

3,254

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1544 වෙනි පිටේ ජලෑන බලනු.

[Hambantota S. O. 146—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ඩබ්ලියු. ඊ. වේට් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවා ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුණොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රාජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලියු. ඊ. වේට්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ

## ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ නැගෙනහිර ගිරුවාපත්තුවේ අඟුණුකොලපැලැස්ස යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සහතික සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මුල් සිතියම 438

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 ... | වක්කරේමූලවැව (වැව) ... ... ... | 5 | 3 | 6 |
| 2 ... | වැවහේන නොහොත් කැලඹගහහේන යනාදිය ... ... | 9 | 3 | 34 |
| 7 ... | බැද්දේවැවපෝටාව ... ... ... | 3 | 1 | 10 |
| 7a ... | බැද්දේවෙලවැකඩ ... ... ... | 1 | 0 | 8 |
| 8 ... | වක්කරේමූලබැද්ද ... ... ... | 2 | 3 | 14 |
| | | 22 | 3 | 52 |

මිට මායිම්—උතුරට කංකානංගම යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට දෙන් අන්ද්‍රිස් සෙනරත්රත්නායක සහ තවත් අය විසින් අයිතිකම්කියන වක්කරේමූලකුඹුරද, ආණ්ඩුව විසින් අයිතිකම්කියන වක්කරේමූලකුඹුරද, දෙන් අන්ද්‍රිස් සෙනරත්රත්නායක සහ තවත් අය විසින් අයිතිකම්කියන වක්කරේමූලකුඹුරද, ආචාරියාගම නොහොත් හැඩකැටිය යන ගමේ ගම්ඉමද; දකුණට හෙලකඩආරද, දෙන් අන්ද්‍රිස් සෙනරත්රත්නායක සහ තවත් අය විසින් අයිතිකම්කියන කම්මලේවත්තද; බස්නාහිරට දෙන් අන්ද්‍රිස් සෙනරත්රත්නායක විසින් අයිතිකම්කියන අඟුණුකොලපැලැස්සේවෙලද, අඑත්වැව යන ගමේ ගම්ඉමද.

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1545 වෙනි පිටේ ප්ලෑන බලනු.

3,255

[Hambantota S. O. 147—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල්හවුස්හි කන්තෝරුවේදී ඩබ්ලියු. ඊ. වේට් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එකී කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රාජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලියු. ඊ. වේට්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

## ඉඩමේ තොරතුරු.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ කරමැටිය යන ගම පිහිටාතිබෙන මිට අමුනාපු සහතික සිතියමේ* පෙනියන 149 මුල් සිතියමේ 6ලත් පෙනෙන රූඩ් 3ක් බිම්තරම ඇති සාමාන්‍යවසයෙන් දන්ගහවත්තේහේන කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට කරලහින්ගේ උක්ඩියා විසින් අයිතිකම්කියන කැටවලදෙනියද ; නැගෙණහිරට ආණ්ඩුව විසින් හේවාගිගනගේ කරෝනිසාට විකුනාපු අඹගහවත්තේහේනද ; දකුණට හින්ගප්පුලිගේ සිලිඳුට ආණ්ඩුව විසින් අබූතක්සේරුවට දීපු දන්ගහවත්තද ; බස්නාහිරට ආණ්ඩුව විසින් හින්ගප්පුලි සිලිඳුට විකුනාපු දන්ගහවත්තද, ආණ්ඩුව විසින් හින්ගප්පුලිගේ සිලිඳුට විකුනාපු දන්ගහවත්තේහේනද.

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1546 වෙනි පිටේ ප්ලෑන බලනු.

3,256

[Kurunegala S. O. 45—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

## ඉඩම්වල තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ හිරියාල හත්පත්තුවේ මහගල්බොඩඑගොඩකෝරලේ තඹගල්ල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සහතික සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

| | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 2,021 | 10005 | මොරලන්දේමූකලාන | 73 | 3 | 20 |
| | 10006 | මොරලන්දේඇලබොඩහේන | 9 | 2 | 37 |
| | 10007 | ඇලබොඩමූකලාන | 0 | 2 | 38 |
| | 10008 | පහලමූකලාන වැලිඅගාරේමූකලාන | 135 | 1 | 0 |
| | 10009 | මහගොඩවලයායේමූකලාන | 74 | 3 | 13 |
| | 10010 | මහගොඩවලහේන්යාය නොහොත් පන්සලගාවාහේන්යාය | 25 | 3 | 30 |
| | 10011 | යෝදයාඇලගාවාහේන | 13 | 1 | 27 |
| | 10012 | රඹයේහේමූකලාන | 12 | 1 | 36 |
| | 10013 | පොල්ගහමූලලන්ද | 1 | 2 | 5 |
| | 10014 | එම | 5 | 2 | 23 |
| | M 1029 | ගුරුන්නැහේලේගමේ කරුවලගහමූලගොඩවලලහේන්යාය | 50 | 1 | 22 |
| | N 1029 | මහවැව | 11 | 2 | 2 |
| | O 1029 | බක්මීගහමූලවැව | 1 | 0 | 21 |
| | P 1029 | ඇහැටුගහමූලහේන | 8 | 1 | 3 |
| | Q 1029 | අළුත්වැව | 3 | 0 | 33 |
| | R 1029 | ඔටුයාය, මැදගලයාය, වැව්හැන්හේයාය, කැප්පිටියාහේන්යාය, වෙල්පිල්ලෑව, ඇත්පන්තියේයාය, අම්බලන්ගොඩැල්ලයාය නොහොත් ගැපල්ලාවවෙලගාවයාය, පාරගාවවත්ත, කොහොඹගහමූලවත්තේඅළුත්කෑල්ල, තිඹිරිගහමූලගාල, දන්ගහමූලගාල, පිටලගාවගාල, පිටලේඉහලකෑල්ල | 697 | 1 | 0 |
| 2,024 | S 1035 | නම්බඩගහමූලගාල | 1 | 1 | 20 |
| | T 1035 | තෙලඹුගහමූලගාල | 0 | 2 | 12 |
| | V 1035 | ගම්බිරිගහගාල | 0 | 0 | 21 |
| | | | 1,127 | 1 | 3 |

මීට මායිම්—උතුරට හිරන්ගොඩ යනගමේ ගම්ඉමද, පොතුවේගම යන ගමේ ගම්ඉමද, මැදගම යන ගමේ ගම්ඉමද; නැගෙණහිරට කලටුවාගම යන ගමේ ගම්ඉමද, කුරුන්දුල්ල යන ගමේ ගම්ඉමද, මූරුතල යන ගමේ ගම්ඉමද; දකුණට ගැපල්ලාව යන ගමේ ගම්ඉමද, පන්නාව යන ගමේ ගම්ඉමද; බස්නාහිරට වන්නිහත්පත්තුවේ ඉමද, (දුදුරුඔය).

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මෙම දැන්වීමෙන් අත්හැරිය වගත් ඒවායේ මුළු බිම්තරමවන අක්කර 61කුත් පර්චස් 5ක ඉහතකී අක්කර 1,127කුත් රූඩ් 1කුත් පර්චස් 3නේ බිම්තරමේ අඩංගු නොවනවගත් මෙයින් දැනගතයුතුයි.

| | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| A 980 | 5252 | ගලකුඹුර නොහොත් ඉහලකුඹුර | 7 | 2 | 38 |
| | 5253 | පහලකුඹුර | 6 | 1 | 1 |
| B 2,024 | G 1034 | වැබඩකුඹුර | 0 | 3 | 32 |
| | H 1034 | දුනුමඩලගහකුඹුර | 0 | 3 | 21 |
| | I 1034 | එම | 1 | 1 | 9 |
| | J 1034 | එම | 0 | 2 | 21 |
| | K 1034 | කෝන්ගහකුඹුර | 1 | 0 | 21 |
| | L 1034 | තුංගහකුඹුර නොහොත් ගම්බිරිගහකුඹුර | 1 | 1 | 24 |
| | M 1034 | නිකගොල්ලපුරන | 1 | 2 | 6 |
| | N 1034 | කදුරුගහපුරන | 0 | 3 | 34 |
| | O 1034 | කදුරුගහකුඹුර | 1 | 1 | 10 |
| | P 1034 | මීගහකුඹුර | 2 | 1 | 2 |
| | Q 1034 | පාළුගහකුඹුර | 2 | 0 | 9 |
| | R 1034 | එම | 1 | 2 | 12 |
| | S 1034 | ලින්දකුඹුර | 2 | 2 | 35 |
| | T 1034 | කෝන්ගහකුඹුර | 2 | 1 | 29 |
| | U 1034 | ගලකුඹුර | 1 | 2 | 2 |
| | V 1034 | බුළුගහකුඹුර | 1 | 2 | 22 |
| | W 1034 | ගන්සූරියගහකුඹුර | 0 | 1 | 31 |
| | X 1034 | එම | 0 | 2 | 7 |
| | Y 1034 | එම | 0 | 1 | 15 |
| | Z 1034 | එම | 0 | 1 | 13 |
| | A 1035 | එම | 0 | 2 | 21 |
| | B 1035 | එම | 0 | 2 | 3 |

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1548 වෙනි පිටේ ප්ලෑන බලනු.

| | බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| | C 1035 | සියඹලාගහකුඹුර නොහොත් ගල්කුඹුර | 1 | 3 | 38 |
| B 2,024 | D 1035 | ගල්කුඹුර | 2 | 1 | 20 |
| | E 1035 | පිටාලේවත්ත | 1 | 0 | 34 |
| | F 1035 | තලගහමුලගාල | 0 | 1 | 14 |
| | G 1035 | දන්ගහමුලවත්ත | 0 | 3 | 0 |
| | H 1035 | කොහොඹගහමුලගාල | 0 | 1 | 14 |
| | I 1035 | කොහොඹගහමුලවත්ත | 0 | 1 | 7 |
| | J 1035 | අඹගහමුලවත්ත | 0 | 1 | 39 |
| | K 1035 | එම | 0 | 1 | 31 |
| | L 1035 | කොස්ගහමුලවත්ත | 0 | 2 | 16 |
| | M 1035 | අප්පුහාමිලාගේවත්ත නොහොත් කෝන්ගහවත්ත | 0 | 3 | 11 |
| | N 1035 | කොහොඹගහමුලවත්ත | 0 | 2 | 4 |
| | O 1035 | නරමානේරුලගේවත්ත | 0 | 3 | 4 |
| | P 1035 | කොහොඹගහමුලවත්ත | 0 | 1 | 37 |
| | Q 1035 | හැලඹගහමුලවත්ත | 0 | 2 | 22 |
| | R 1035 | කෙට්ටගස්පිටියේගාල | 1 | 2 | 14 |
| | U 1035 | අමුනේවත්ත | 0 | 3 | 28 |
| | W 1035 | කොහොඹගහවත්ත | 0 | 0 | 38 |
| | X 1035 | තලගහමුලගාල | 0 | 1 | 4 |
| C 2,024 | Y 1035 | කොහොඹගහකුඹුර | 1 | 1 | 17 |
| | Z 1035 | බක්මීගහකුඹුර | 1 | 2 | 1 |
| | A 1036 | එම | 0 | 2 | 0 |
| | B 1036 | වැබොඩකුඹුර | 1 | 1 | 34 |
| | | | 61 | 0 | 5 |

3,257

---

[Anuradhapura S. O. 37—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එහින් කොටසකට හෝ අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ඩබ්ලියු. ඊ. වෙට් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනිසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එකී කොටසකට අයිතිකම පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඩබ්ලියු. ඊ. වෙට්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

---

ඉඩමේ තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ නුරුවේ පලාතේ උලගල්ලකෝරලේ නාච්චාතුලානේ කුඩාකඹුමුල්ල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සහතික සිතියමේ* පෙනියන 410 මුල් සිතියමේ $5^2$න් පෙනෙන පර්චස් 27ක් බිම්තරම ඇති සාමාන්‍යවසයෙන් අක්කරේවෙල වැඩිබිම කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසියේ ප්‍රකාර රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු කුඩාකඹුමුල්ලේහේනද; නැගෙනහිරට 158,105 පිඹුරු කඩදාසියෙන් පෙනෙන ඉඩමද; දකුනට සහ බස්නාහිරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසියේ ප්‍රකාර රජසන්තක හැටියට ප්‍රසිද්ධකරපු කුඩාකඹුමුල්ලේහේනද.

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1550 වෙනි පිටේ ප්ලෑන බලනු.

3,258

---

[Uva S. O. 40—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ජේ. ජී. ෆ්‍රේසර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනිසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ජී. ෆ්‍රේසර්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

---

ඉඩම්වල තොරතුරු.

ඌව දිසාවේ වියළුව කොඨාසයේ සොරනාතොටකෝරලේ උතුරු ලියදිපිටිය යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සහතික සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කෑලි, එනම් :—

I.

මුල් සිතියම 85.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 2 | ඇල්අරාවේහේන, කුඹුගලේහේන | 26 | 2 | 0 |

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1551—1552 වෙනි පිටුවල ප්ලෑන් බලනු.

මීට මායිම්—උතුරට කිතුල්වත්ත යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට කිතුල්වත්ත යන ගමේ ගම්ඉමද, අඩිපාරක්ද; දකුණට තොටපලකඳුරද, ඇල්අරාවේගෙදර රත්නායකමුදියන්සේලාගේ හේරත්අප්පු විසින් අයිතිකම් කියන කෝවිල්ලන්දද, කිරින්දේගම යන ගමේ ගම්ඉමද; බස්නාහිරට කිරින්දේගම යන ගමේ ගම්ඉමද, වෙලගෙදර වත්තේ බින්දුවා සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන වෙලගෙදරවත්තද, අඩිපාරක්ද, වෙලගෙදරවත්තේ බින්දුවා සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන වෙලගෙදරවත්තද, කිරින්දේගම යන ගමේ ගම්ඉමද.

II.

මූල් සිතියම 85.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 2a .. | කෝවිල්ලන්ද, මගඅරාවේලන්දේයාය, කැටවිල්ලාකැටිය නොහොත් මගඅරාවේලන්ද, ඇල්අරාවේලන්ද ... ... ... | 16 3 30 |

මීට මායිම්—උතුරට ඇල්අරාවේගෙදර රත්නායකමුදියන්සේලාගේ හේරත්අප්පු විසින් අයිතිකම්කියන කෝවිල්ලන්දද, ඇල්අරාවේගෙදර කිරිවන්තේ විසින් අයිතිකම්කියන කෝවිල්ලන්දේවත්තද; නැගෙනහිරට ඇල්අරාවේගෙදර රත්නායකමුදියන්සේලාගේ හේරත්අප්පු සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන ඇල්අරාවේවත්තද, ඇල්අරාවේ අප්පුහාමි සහ සියාතු විසින් අයිතිකම්කියන ඇල්අරාවද, ඇල්අරාවේගෙදර සියාතු සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන ඇල්අරාවේවත්තද, හින්නාරංගහකුඹුර යන ගමේ ගම්ඉමද; දකුණට කිරිවන්තේ ගමරාල සහ තවත් අයවළුන් විසින් අයිතිකම්කියන මගඅරාවේවත්තද; බස්නාහිරට කිරින්දේගම යන ගමේ ගම්ඉමද.

3,259

---

[Uva S. O. 41—1908]

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28 වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ මෝදර හිල් හවුස්හි කන්තෝරුවේදී ජේ. ජී. ෆ්‍රේසර් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුණොත්, එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙණහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රාජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ජේ. ජී. ෆ්‍රේසර්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

ඌව දිසාවේ වෙල්ලස්ස කොට්ඨාසයේ මැදගම්පත්තුකෝරලේ පුබ්බාරේ යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සහතික සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.

මූල් සිතියම 153.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 171 ... | ගලඅරාවේවැට්ටිය ... ... ... | 0 0 35 |

මීට මායිම්—උතුරට කොටලින්දකඳුරද; නැගෙණහිරට ඩින්ගිරිමැණිකා විසින් අයිතිකම්කියන ගලඅරාවද, (දෙලක්ද); දකුණට ඇල්කොටුවේගෙදර රන්මැණිකා විසින් අයිතිකම්කියන මඩුගහඅරාවේ අගතේද (209,613 පිඹුරු කඩදාසියේ ජේන ඉඩම); බස්නාහිරට කොටලින්දකඳුරද.

II.

මූල් සිතියම 153.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. රූ. ප. |
|---|---|---|
| 171b ... | ගලඅරාව ... ... ... ... | 0 0 20 |

මීට මායිම්—උතුරට කොටලින්දකඳුරද; නැගෙණහිරට ඩින්ගිරිමැණිකා විසින් අයිතිකම්කියන ගලඅරාවද, (205,715 පිඹුරු කඩදාසියේ ජේන ඉඩම); දකුණට දෙලක්ද, ඇල්කොටුවේගෙදර රන්මැණිකා විසින් අයිතිකම් කියන මඩුගහඅරාවේඅගතද (209,613 පිඹුරු කඩදාසියේ ජේන ඉඩම); බස්නාහිරට අණ්ඩුව විසින් අයිතිකම්කියන ගලඅරාවවැට්යද.

* ඉංග්‍රීසි පිටපතේ හතරවෙනි කාණ්ඩයේ 1553—1554 වෙනි පිටුවල ප්ලෑන් බලනු.

3,260

---

[Tenders for the Civil Medical Department.]

1. වර්ෂ 1909යේ අවුරුද්ද තුළ කොළඹ මහ ඉස්පිරිතාලයේ ගෙවන වාට්ටුවල රෙදි ඇපිල්ලීමට ටැන්ඩර්ස් වලින් ඉල්ලුම්කළ යුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර කොළඹ ප්‍රධාන සිවිල් වෛද්‍යවායඝීතැනට කියා පිට නම ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර මෙම කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි, නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්වල ඇන්විලොප් එකේ වම් පැත්තේ ඉහල "කොළඹ මහ ඉස්පිරිතාලයේ ගෙවන වාට්ටුවල රෙදි ඇපිල්ලීමට ටැන්ඩර්ය" (Tender for washing soiled linen of the paying section of the General Hospital) යන වාසගම ලියා 1908 නොවැම්බර් මස 24 වෙනි දින දවල් 12ට ප්‍රථම මෙම කන්තෝරුවට ලැබිය යුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප් එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යවායඝීතැනගෙන් ලබාගතහැකි පෝර්ම්කොලවල ඉල්ලුම්කළ යුතුයි. නියම පෝර්ම කොලවල නැතුව

වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි.

6. රු. 50ක් පෝර්මකොල ඉල්ලුම්කරන්ට ප්‍රථම විරුෂරිගේ හෝ කච්චේරියේ මුදල් බැඳ කුවිතාන්සිය ලබාගෙන, ඒ කුවිතාන්සිය දී පෝර්මකොල ලබාගත යුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කීවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇප ආදිය දෙන්ට බැරිවුනොත් එම අය විසින් පෝර්මකොල ගන්ට බැඳපු මුදල රජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු පෝර්මකොල ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

7. කොන්ත්‍රාත්තුව ඉෂ්ටකිරීමට ඇපවීමට ඕනෑකලොත් වගකියහැකි දෙදෙනෙක් අත්සන්කරණලද ලියමණක් ටැන්ඩරය කැටුව එවියයුතුයි.

8. භාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් මුදලෙන් ඇප රු. 100ක් තිබං ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. පෝර්මකොල ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් භාරගනු ලැබේ. භාරගන්ට යෙදුන ටැන්ඩරයක අයිතිකාරයා මනාපවිටක මුදල් වෙනුවට සහතිකකරපු ඉඩම්ඔප්පු තිබා අළුත් පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට පුළුවන. මේ ගැන වෙන්නාවූ සියලුම වියදම් ඔහු විසින් දරන්ට ඕනෑය. වැඩිදුර කාරණා මහ ඉස්පිරිතාලය භාරවසිටින වෛද්‍යවායසීතැනගෙන් දැනගත හැකිය.

9. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ට නොකරන්නාවූ ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළිනොගන්න බව දතයුතුයි. යම් ටැන්ඩරයක් එවන්ට මත්තෙන් එම ටැන්ඩරයේ යම් වරදක් කපාගා හරිගස්සන්ට ඕනෑකලොත්, ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුල් අකුරු තබන්ට ඕනෑය. එසේ නොකලොත් එම ටැන්ඩරය ඒත්තුනොගන්න බව දතයුතුයි.

10. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් භාරගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

සී. ටී. ග්‍රිෆින්,

ප්‍රධාන සිවිල් වෛද්‍යවායසී සහ ඉන්ස්පැක්ටර් ජනරාල්තැන වෙනුවට.

වෂ් 190?ක්වූ ඔක්තෝම්බ්‍ර මස 30 වෙනි දින කොළඹදීය.

---

[Tenders for the Civil Medical Department.]

1. වෂ් 1909ක්වූ අවුරුද්ද තුළ ගොනෙකු සහ එළවන්නෙක් මෙහි පහත සඳහන්වන වැඩවලට සැපයීමට ටැන්ඩර්ස් ලබන දෙසැම්බ්‍ර මස 8 වෙනි අඟහරු දින දවල් 12 වනතුරු භාරගනුලැබේ.

කොළඹ මහඉස්පිරිතාලයේ සහ සොයිසා වදන ඉස්පිරිතාලයේ මිනිකා:ත්තයේ මිනි ගෙනයාමට සහ කනත්තේ වසූරි ඉස්පිරිතාලයට බෝවෙන ලෙඩ සෑදුන අයවල් ගෙනයාමටත් මැඩිකල් කොලීජයේ සිට මිනි කපන කාමරයට මිනි ගෙනියන්ට සහ ගේන්වත් ලබන ජනවාරි මස 1 වෙනි දින සිට දෙසැම්බ්‍ර මස 31 වෙනි දින වන තෙක්ම කරන්ට කැමති අයවල් ඉල්ළුම්කළ යුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැන නමට පිට ලියා එවන්ට ඕනෑය.

3. භාරගන්ට යෙදුන කොන්ත්‍රාත්කාරයා විසින් එළවන්නා සහ ගොනත් ඕනෑවුනුවිටක සැපයීමට අයෙක් නිතර ඉස්පිරිතාලයේ නවත්වන්ට ඕනෑය.

4. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගෙන් ලබාගතහැකි පෝර්ම කොලවල ඉල්ලුම්කළ යුතුයි. නියම පෝර්ම කොලවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්නා බව දතයුතුයි. තවද එහි අමුනාතිබෙන ටැන්ඩරය සහ සැබුල් එකේ වගකියන්ට පුළුවන් සාක්ෂිකාරයෝ දෙදෙනෙක් ඉස්සරහ අත්සන් තබන්ට ඕනෑය.

5. පෝර්මකොල ඉල්ලුම්කරන්ට ප්‍රථම විරුෂරිගේ හෝ කච්චේරියේ මුදල් රු. 25ක් බැඳ කුවිතාන්සිය ලබාගෙන, ඒ කුවිතාන්සිය දී පෝර්මකොල ලබාගත යුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කීවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇප ආදිය දෙන්ට බැරිවුනොත් එම අය විසින් පෝර්මකොල ගන්ට බැඳපු මුදල රජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු පෝර්මකොල ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

6. භාරගන්ට යෙදුන අය විසින් පෝර්මකොලවලට බැඳපු මුදල ඇප මුදලෙන් කොටසක් මෙන් කොළඹ කච්චේරියේ මා නමට බඳිනුලැබේ.

7. ටැන්ඩරය එවන්ට මත්තෙන් එහි යමක් වෙනස් කරන්ට ඕනෑකලොත් ඔහුගේ අත්සනේ මුලකුරු එහි තබන්ට ඕනෑය. එසේ නැතුව එන ටැන්ඩර් භාරගනු නොලැබේ.

8. මේ ගැන වැඩිදුර කාරණා ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගෙන් දැනගන්ට පුළුවන.

9. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් භාරගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

(අත්සන්කළේ), සී. ටී. ග්‍රිෆින්,
ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැන වෙනුවට.

වෂ් 1908ක්වූ නොවැම්බ්‍ර මස 4 දින කොළඹ ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගේ කන්තෝරුවේදීය.

---

[Tenders for the Civil Medical Department.]

1. වෂ් 1909යේ අවුරුද්ද තුළ මහනුවර ඉස්පිරිතාලයට එළකිරි සැපයීමට ටැන්ඩර්ස්වලින් ඉල්ලුම්කළ යුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩ්හි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Controller of Revenue, Colombo) කියා පිට නම ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි, නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්වල ඇන්විලොප් එකේ වම් පැත්තේ ඉහල "———— ඉස්පිරිතාලයට කිරි සැපයීමට ටැන්ඩරය" (Tender for supplying Fresh Cow-milk, ————Hospital) යන වාසගම ලියා 1908 දෙසැම්බ්‍ර මස 8 වෙනි දින දවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ (Controller of Revenue) කන්තෝරුවට ලැබිය යුතුය. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප් එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගෙන් හෝ ඒ ඒ ඉස්පිරිතාලවල සිවිල් දොස්තර මහත්වරුන්ගෙන් ලබාගතහැකි පෝර්ම කොලවල ඉල්ලුම්කළ යුතුයි. නියම පෝර්ම කොලවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි.

6. පෝර්මකොල ඉල්ලුම්කරන්ට ප්‍රථම විරුෂරිගේ හෝ කච්චේරියේ මුදල් රුපියල් 25ක් බැඳ කුවිතාන්සිය ලබාගෙන, ඒ කුවිතාන්සිය දී පෝර්මකොල ලබාගත යුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කීවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇප ආදිය දෙන්ට බැරිවුනොත් එම අය විසින් පෝර්මකොල ගන්ට බැඳපු මුදල රජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු පෝර්මකොල ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

7. කොන්ත්‍රාත්තුව ඉෂ්ටකිරීමට ඇපවීමට ඕනෑකලොත් වගකියහැකි දෙදෙනෙක් අත්සන්කරණලද ලියමණක් ටැන්ඩරය කැටුව එවියයුතුයි.

8. ඕනෑකලොත් ඒත්තුගන්ට යෙදුන බඩුවලින් මෝස්තු (samples) දියයුතුයි.

9. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් මුදලෙන් ඇප රු. 50ක් තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. පෝර්මකොල ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් බාරගනු ලැබේ. බාරගන්ට යෙදුන ටැන්ඩරයක අයිතිකාරයා මනාපවීටක මුදල් ලෙවනුවට සහතිකකරපු ඉඩම්ඔප්පු තිබා අළුත් පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට පුළුවන. මේ ගැන වෙන්නාවූ සියලුම වියදම් ඔහු විසින් දරන්ට ඕනෑය. වැඩිදුර කාරණා ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගෙන් දැනගත හැකිය.

10. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ට නොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළි නොගන්න බව දතයුතුයි. යම් ටැන්ඩරයක් එවන්ට මත්තෙන් එම ටැන්ඩරයේ යම් වරදක් කපුගා හරිගස්සන්ට ඕනෑකළොත්, ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුල් අකුරු තබන්ට ඕනෑය. එසේ නොකළොත් එම ටැන්ඩරය ඒත්තුනොගන්න බව දතයුතුයි.

11. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් බාරගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

(අත්සන්කළේ), සී. ටී. ග්‍රිෆින්,
ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැන වෙනුවට.

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 12 දින කොළඹ ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගේ කන්තෝරුවේදීය.

---

[Tenders for the Civil Medical Department.]

1. වර්ෂ 1909යේ අවුරුද්ද තුළ මීට අමුනා තිබෙන ලැයිස්තුවේ පෙනෙන එක එක ඉස්පිරිතාලයට කෑම සැපයීමට ටැන්ඩර්ස්වලින් ඉල්ලුම්කළ යුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩ්හි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Controller of Revenue, Colombo) කියා උට නම ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි; නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්ස්වල ඇන්විලොප් එකේ වම් පැත්තේ ඉහල "———ඉස්පිරිතාලයට කෑමදීමට ටැන්ඩර්ය" (Tender for provisioning the———Hospital යන වාසගම ලියා 1908 දෙසැම්බර් මස 8 වෙනි දින දවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ (Controller of Revenue) කන්තෝරුවට ලැබිය යුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප්එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගෙන් ලබාගතහැකි පෝර්ම කොලවල ඉල්ලුම්කළ යුතුයි. නියම පෝර්ම කොලවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළොට භාරනොගන්න බව දතයුතුයි.

6. පහත පෙනෙන ලැයිස්තුවේ ආකාරයට පෝර්ම කොල ඉල්ලුම්කරන්ට ප්‍රථම ට්‍රෙෂරියේ හෝ කච්චේරියේ මුදල් බැඳ කුවිතාන්සිය ලබාගෙන, ඒ කුවිතාන්සිය දී පෝර්මකොල ලබාගත යුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කීවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇප ආදියදෙන්ට බැරිවුනොත් එම අය විසින් පෝර්මකොල ගන්ට බැඳපු මුදල රජසන්තකවෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සම්පූර්ණයින් පසු පෝර්මකොල ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

7. කොන්ත්‍රාත්තුව ඉෂ්ටකිරීමට ඇපවීමට ඕනෑකළොත් වගකියහැකි දෙදෙනෙක් අත්සන්කරණලද ලියවිල්ලක් ටැන්ඩරය කැටුව එවියයුතුයි.

8. ඕනෑකළොත් ඒත්තුගන්ට යෙදුන බඩුවලින් මෝස්තර (samples) දිය යුතුයි

9. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් මීට අමුනා තිබෙන ලැයිස්තුවේ තිබෙන ප්‍රකාරයට මුදලෙන් ඇප තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. පෝර්මකොල ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් බාරගනුලැබේ. රුපියල් 500 නොහොත් ඊට වැඩියේ ඇප බඳින්ට ඕනෑ කොන්ත්‍රාත්කාරයෝ ඉල්ලුම්කළොත් ඔවුන්ගේ මුදල් ලංකාවේ තිබෙන බැංකුවක ස්ථිරවශයෙන් (fixed deposit) තබන්ට පුළුවන. බාරගන්ටයෙදුන ටැන්ඩරය අයිතිකාරයා මනාපවීටක මුදල් වෙනුවට සහතිකකරපු ඉඩම්ඔප්පු තිබා අලුත් පොරොන්දු ඔප්පුවකට බැඳෙන්ට පුළුවන. මේ ගැන වෙන්නාවූ සියලුම වියදම් ඔහු විසින් දරන්ට ඕනෑය. වැඩිදුර කාරණා ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගෙන් දැනගත හැකිය.

10. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ට නොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළි නොගන්න බව දතයුතුයි. යම් ටැන්ඩරයක් එවන්ට මත්තෙන් එම ටැන්ඩරයේ යම් වරදක් කපුගා හරිගස්සන්ට ඕනෑකළොත්, ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුල් අකුරු තබන්ට ඕනෑය. එසේ නොකළොත් එම ටැන්ඩරය ඒත්තුනොගන්න බව දතයුතුයි.

11 යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් බාරගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

| ඉස්පිරිතාලයේ නම. | පෝර්මකොලවලට බැඳිය යුතු මුදල. රුපියල්. | ඇපතිබිය යුතු මුදල. රුපියල් |
|---|---|---|
| දඹුල්ලේ කුලිකාරයින්ගේ ඉස්පිරිතාලය | 125 | 250 |
| කල්මුණේ සිවිල් ඉස්පිරිතාලය | 150 | 300 |
| පොයින්ට්පේද්‍රුරුවල සිවිල් ඉස්පිරිතාලය | 75 | 150 |
| දන්බුගම ෆීල්ඩ් ඉස්පිරිතාලය | 100 | 200 |
| මඩකලපුවේ සිවිල් ඉස්පිරිතාලය | 125 | 250 |

(අත්සන්කළේ), සී. ටී. ග්‍රිෆින්,
ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැන වෙනුවට.

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 12 දින කොළඹ ප්‍රධාන සිවිල් වෛද්‍යවායසීතැනගේ කන්තෝරුවේදීය.

---

[Tenders for the Civil Medical Department.]

වර්ෂ 1909යේ අවුරුද්ද තුළ ගාල්ලේ ප්‍රොවින්ෂල් සර්ජන් කන්තෝරුවේ සිට මෙහි පහත පෙනෙන බේත්සාලාවලට සහ ඉස්පිරිතාලවලටත් බෙහෙත් සහ ලියවිමට ඕනෑකරන ද්‍රව්‍යයන් ගෙනයාමට ටැන්ඩර්ස් මුද්‍රකරපු කවරයපිට මෙසේ ලියා "බඩුගෙනයාමට ටැන්ඩර්ස්" ලබන දෙසැම්බර් මස 8 වෙනි දින දවල් 12 වනතුරු බාරගනු ලැබේ.

| ගමේ නම. | | ලඟම රේල්වේ ස්ටේෂමේ සිට දුර, හැතැප්ම. |
|---|---|---|
| අලුත්නුකොලපැලැස්ස | ... | 64 |
| බද්දේගම | ... | 12 |
| බටපොල | ... | 18 |
| බෙලිඅත්ත | ... | 43 |
| බෙර්ලපනලිය | ... | 53 |
| දෙනියාය | ... | 53¼ |
| දියන්තර | ... | 48 |
| ඇල්පිටිය | ... | 25 |
| හක්මන | ... | 42 |
| හිනිදුම | ... | 33 |

| ගමේ නම. | | ළඟම රේල්වේ ස්ටේෂමමේ සිට දුර, හැතැප්ම. |
|---|---|---|
| ඉමාදූව | ... | 13½ |
| තළුවාන | ... | ,76 තන්ගල්ල පාරේ |
| කිරම | ... | 70 |
| කටපොල | ... | 46 |
| මොරවක | ... | 40 |
| කාගොඩ | ... | 18 |
| රෙසිම | ... | 58 |
| තලව | ... | 69 |
| තිහගොඩ | ... | 32 |
| උඩුගම | ... | 24 |
| වලස්මුල්ල | .. | 62 |
| වදුරඹ | ... | 13 |
| වීරකැටිය | ... | 60 |
| කොටගොඩ | ... | 36 |
| දික්වැල්ල | ... | 40 |

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩිකි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Controller of Revenue, Colombo) කියා පිට නම් ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි; නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් ලබාගතහැකි ෆෝර්ම කොලවල ඉල්ලුම්කළ යුතුයි. නියම ෆෝර්ම කොලවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි.

5. ෆෝර්මකොල ඉල්ලුම්කරන්ට ප්‍රථම චරණෂරියේ හෝ කච්චේරියේ මුදල් රු. 25ක් බැඳ කුවිතාන්සිය ලබාගෙන, ඒ කුවිතාන්සිය දී ෆෝර්මකොල ලබාගත යුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කිවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇප ඇදිය දෙන්ට බැරිවුනොත් එම අය විසින් ෆෝර්මකොල ගන්ට බැඳපු මුදල රාජසන්තක වෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු ෆෝර්මකොල ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

6. කොන්ත්‍රාත්තුව ඉෂ්ටකිරීමට ඇපවීමට ඕනෑකළොත් වගකියහැකි දෙදෙනෙක් අත්සන්කරණලද ලියමණක් ටැන්ඩරය කැටුව එවියයුතුයි.

7. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් මුදලෙන් ඇප රුපියල් 100ක් ඔහුගේ ටැන්ඩරය බාරගත් සුමාන 2ක ඇතුළත බඳින්ට ඕනෑය.

8 යම් ටැන්ඩරයක් එවන්ට මත්තෙන් එම ටැන්ඩරයේ යම් වරදක් කටුගා හරිගස්සන්ට ඕනෑකළොත්, ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුල් අකුරු තබන්ට ඕනෑය. එසේ නොකළොත් එම ටැන්ඩරය ඒත්තුනොගන්නා බව දතයුතුයි.

9. වැඩිදුර කාරණා ගාල්ලේ ප්‍රොවින්ෂල් සාර්ජන්ගෙන් හෝ පළමුවෙනි ඉන්ස්පැක්ටර්තැනගෙන් දැනගන්ට පුළුවන.

10. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් බාරගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

(අත්සන්කළේ), සී. වී. ග්‍රිෆින්,
ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැන වෙනුවට.

වර්ෂ 1908ක්වූ නොවැම්බර් මස 12 දින කොළඹ ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගේ කන්තෝරුවේදීය.

[Tenders for the Civil Medical Department.]

1. වර්ෂ 1909යේ අවුරුද්ද තුළ බන්ඩාරවෙල රේල්වේ ස්ටේෂන්පලේ සිට මෙහි පහත පෙනෙන බෙහෙත් ශාලාවලට සහ ඉස්පිරිතාලවලටත් බෙහෙත් සහ ලියවීමට ඕනෑකරන ද්‍රව්‍යයන් ගෙනයාමට ටැන්ඩර්ස් - මුද්‍රකරපු කවරයපිට මෙසේ ලියා "බඩුගෙනයාමට ටැන්ඩර්ස්" ලබන දෙසැම්බර් මස 8 වෙනි දින දවල් 12ට වන්තුරු බාරගනුලැබේ.

| ගමේ නම. | | ළඟම රේල්වේ ස්ටේෂන්පල. | |
|---|---|---|---|
| අළුත්නුවර | ... | 48 | හැතැප්ම. |
| බදුල්ල | ... | 18 | ,, |
| බන්ඩාරවෙල | .. | ¼ | ,, |
| බිබිල | ... | 56 | ,, |
| එනුගල | ... | 44 | ,, |
| මඩුල්සීමේ | ... | 42 | ,, |
| මැදගම | ... | 66 | ,, |
| පස්සර | ... | 30 | ,, |
| නමුණුකුල | ... | 17 | ,, |
| හල්දෙන | ... | 28 | ,, |
| වැලිමඩ | ... | 10 | ,, |

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩිකි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Controller of Revenue, Colombo) කියා පිට නම ලියා එවිය යුතුයි.

